# වැඩිහිටියන් සඳහා නොමිලේ අක්ෂි කාච ලබාදීමේ වැඩසටහන - 2024

## හැඳින්වීම

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මගින් වැඩිහිටි ප්‍රජාවගේ සුභසාධනය ඉහළ නැංවීමේ අරමුණින් අඩු ආදායම්ලාභී වැඩිහිටියන් වෙත නොමිලේ ( අක්ෂි දුර්වලතාවලින් පෙලෙන ) අක්ෂි කාච ලබාදීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි.

## ප්‍රතිලාභීන් තෝරා ගැනීම

- ශ්‍රී ලංකාවේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පුරා විසිර සිටින අක්ෂි ආබාධ සහිත, වයස අවුරුදු 60 ඉක්මවූ සහ අඩුආදායම්ලාභී වැඩිහිටියන් සඳහා පමණක් මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ.

## අයදුම්පත් ඉදිරිපත් කිරීම

- වැඩිහිටියාගේ තොරතුරු නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් මගින් ලබා ගත යුතුය. ( වෛද්‍ය වාර්තාව ඇමුණුම මගින් ලබා ගැනීම නොකල යුතු අතර වෛද්‍යවරයාගේ නිර්දේශ මත අයදුම්පතෙහිම සඳහන් කොට ඇති අයදුම්පත් පමණක් ලබා ගැනීම කල යුතුය )
- අයදුම්කරු අක්ෂිකාච අවශ්‍යතාවයක් ඇත්තෙකු බවට රජයේ ලියාපදිංචි වෛද්‍ය වරයෙකු විසින් අයදුම්පත්‍රයෙහි සඳහන් පරිදි නිර්දේශ කළ යුතුය.
- අදාල අයදුම්කරු සුදුස්සෙකු බවට අයදුම්පතෙහි ග්‍රාම නිලධාරි හා වැඩිහිටි විෂය සම්බන්ධ ක්ෂේත්‍ර නිලධාරි විසින් සහතික කර ප්‍රාදේශීය ලේකම් විසින් අනුමත කර තිබිය යුතුය.

## ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය

- ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් නිවැරදිව සම්පූර්ණකර එවන ලද අයදුම්පත් ලැබෙන පිළිවෙල අනුව ලේඛනගත කෙරේ.
- එසේ ලේඛන ගත කිරීමෙන් පසුව අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අක්ෂි කාච ලබාදීමට කටයුතු කිරීම. අක්ෂි සැත්මක කිරීමෙන් පසුව තොරතුරු පුරවා එවීමට අදාල ව ආකෘතිය ද දක්වා ඇත. )
- තවද අක්ෂි ශල්‍යකර්ම සිදු කරන රෝහල් මගින් කෙරෙන ඉල්ලීම් සඳහාද අක්ෂිකාච ලබා දීමට අපේක්ෂා කරන බවද දන්වා සිටිමි. ( වයස අවුරුදු 60 සම්පූර්ණ වීම හා අඩුආදායම්ලාභී ප්‍රතිලාභීන් සඳහා )
- එසේම 2023 වර්ෂය මෙන්ම 2024 වර්ෂය සඳහාද හෙල්ප්ඒජ් ආයතනය හා සම්බන්ධ වෙමින් අක්ෂි කාච ලබාදීමට අපේක්ෂා කෙරේ. ( වයස අවුරුදු 60 සම්පූර්ණ වීම හා අඩුආදායම්ලාභී ප්‍රතිලාභීන් සඳහා )
- අක්ෂි කාච ප්‍රතිලාභියාට ලබාදුන් බවට වන අත්සන් ලේඛණය එවීමට කටයුතු කල යුතු අතර ශල්‍යකර්මය සිදුකිරීමෙන් අනතුරුව ප්‍රතිලාභියාගේ තොරතුරු ඇතුලත් වාර්තාවට අදාල ආකෘතිය වෛද්‍යවරයා ලවා සම්පූර්ණ කොට නිලධාරියා විසින් ඉදිරි කටයුතු සඳහා, ප්‍රාදේශීය ලේකම් මගින් වැඩිහිටි මහලේකම් කාර්යාලය වෙත එවිය යුතුය.

කේ. ජී. ලැනරෝල්
අධ්‍යක්ෂ